

## දැහැන

ගුවනත පුරා විහිදෙන කඳු මඩල උඩින්
ඇසෙනා ගීත මට සක්වා ලිහිණි හඬින්
සවනත ගැටෙන විට පිබිදෙන සිහිනා ලොවින්
මා බැඳි දැහැන මට සුරකිය හැකිද ඉතින්.

ආපසු හැරී බලනා මග පෙනෙන දුර
හිස් බව පමණි දුටුවේ මා නගා වෙර
කඳුලින් ඉපිදී මගෙ දෙනෙතේ තිමිර තිර
අවසර නොදේ දැකුමට මට අවර ගිර

වරමක් නොමැත මගෙ හැඟුමන් පවසන්න
පිංකම් කරමි ජීවන මග දිරී ගන්න
අකමැති උනත් කිසි දිනකදී පරදින්න
උරුමය එයයි සැරසෙමි එය පිලිගන්න

ගත නිසසලය වරකදී සිත සසල කරන්
යා හැකි වේද එතරට මට සසර තෙරෙන්
වරකදී කැඩෙන දැහැනට සිත යොදමි වැරෙන්
පුරනෙමි පාරමී දම් මම හදට හොරෙන්.

විජයසිරි තිලකුමාර බ්‍රිස්බේන්

## දුවකට ලියූ කවිය

අසීමිත නිදහසේ
පියඹන කුරුළු කැළ...
කූඩුවක රඳවන්න
නොහැකි බව පසක් කල
මවු පියෝ මග බලති..
නොදැන කොහි තැනෙක උන්
සැඟව ගියෙදැයි මේදින.

ස්වේසමක රාත්‍රිය නිදිකිරන
නිමේෂය මුවාකල
කනිසමේ කෙඳිරිල්ල,
තැති ගනී හදිසියේ
මැදියමේ හෝරාව
ලකුණු කර...
මුළු දෙරන ඔසවාන
හඬායන රේල්රිය
විසි කලේ නිදාවැටි
පරවී පෙළ.

සිහිල් වුව මුදු සුළඟ
සහනයක් නොවේ එය
කරුවලද දැඩිවිය
බෙදා බිය, ඉරා සිත.

සෙවනැල්ල වුව නුඹේ
සැපකි දැවෙනා හදට
පමා නොම වී
වරෙන්
ඉර නුඹය මා ලොවට.

චන්ද්‍රිකා ද සිල්වා

# සුපුරුදු සුවඳ

ළඳුන් දෙදෙනෙක් ය
පිවිසුණු සටනකට
දිනා ගැනුමට ය මා සිත

එකියක් වැනිය සුර ලියක්
යුතු සිසිවන වුවනින්
නිසි පුළුලුකුලින්

රිදී සීනු හඬ දෙනු නොවේ
ඇයගෙ හසරැලිය ඒ

මගේ වියැලුණු දෙතොල්
තෙමාලන මී බිඳු ය
වෑහෙන්නෙ ඇයගෙ
නා දළු සගලින්

රජුන් වෙත නොම පිදුණු
මා වෙනුවෙන් මැවුණු
සෙනෙහසෙහි සිසිලසින්
නිවයි ඈ මහද ගිනි

අනෙක් ළඳ වියපත් ය
දුබල ය අසරණ ය
කළ්‍යාණි පංචකය
පලා ගොස් බෝ කල් ය

එනමුදු අරුම කිම
සටනින් ඈ දිනන
විමසලා බලමි මම
යොදවමින් මගෙ නැණස

විලාසිනියගෙ විලවුන් සුවඳ
පරයා
හමන සුවඳ මහළු ළඳ වෙතින්
සුපුරුදු ය බෝ බල ය

කුමන සුවඳක් ද ඒ
වැටහුණේ අවසන ය

රටක් තැනූ
දැයක් දිනූ
ලොවක් පාලනය කළ
මව් කිරි සුවඳ ය ඒ..

ඩබ්.ජයන්ත ඈපා





## අසිරිමත් දැක්මක්

කඳුළු පිරවුණ දෙනෙත් දල්වා
අසරණව පිහිටක් පතද්දී
ඔබේ දසැඟිලි මගේ ගෙල මත
තබා තද කර වියරු සිහියෙන්
රැදුරු බැල්මක් හෙලා, දොඩවා
මගේ දිවි තොර කරන්නට ඔබ
එදා ගත් වෙහෙසක හැටි..

මගේ අසරණ කමට පිහිටක්
සොයා ගෙන ඔබ වෙත පැමිණි කල
මොකද දෙවියනි සිදු වුණේ..?
වැටත් නියරත් ගොයම් කා නම්
පැමිනිල්ල කා වෙත කරන්නද..?

පතා ගෙන ගැලවුමක් මරණින්
බැගෑපත් ලෙස මා යදිද්දී
මගේ ගෙල මත තිබූ දසැඟිලි
දරුණු විලසින් තද කෙරූ හැටි..

වේදනාවෙන් මගේ හදවත
හරෑයි කියලා සිතුවෙහි ද ඔබ
වේදනාවට මගේ හදවත
සිනහා වෙන බව නොදන්නෙ ද ඔබ..?

එහෙත් ඉන් එක මොහොතකට පසු
බිඳෙන් බිඳ හදවතින් පිට වුණ
හුස්ම පොදි දැක උමතු බැල්මෙන්
දොහොත් බඳිමින් ඔබ හරෑද්දී
විමතියට පත් මගේ හදවත
හැරුූ හැටි මට අදත් පුදුමෙකි..

හැබෑවක් දෝ.. සිහිනයක් දෝ..
විහිළුවක් දෝ.. අරුමයක් දෝ..
අග මුලක් නැති ගැටළු රැසකින්
වෙලී පිළිතුරු පතා ගෙන මම
ඔබේ නෙත් යුග තුළට එබුනෙමි
සැලෙන හිතකින් ඔබට රහසේ..

දෙනෙත් රතුපුල් වගේ තිබුණා
දෙතොල් තද කොට වැසී තිබුණා
මුහුණ කළු වී ඔබේ දසුනින්
ඉතා බියකරු බවක් මැවුණා..

එහෙත් මම තව දෙයක් දුටුවා
ඉතා පියකරු දෙයක් දුටුවා
ඔබට හිමි වුණ අමිල හදවත
කිසිම වෙනසක් නොවී තිබුණා..

මාලා කරුණාතිලක
කුරුණෑගල

## පහන් වැට

පැටලුනු බඹරා

මී විතෝන් බලේ බඹර බොල්වී
ලමැද සිවරෙ නුරා බැල්මෙන්
අහසා නැමුමෙන් නටන මගේ නෙත
නිදි කිරනා සෙයි හුනුව දිස්විත.

වේග රිද්මයට නටන මා ගැන දෙස
රිදුනු අත් අයගේ ඇස් පමුනු මා නෙත.
නුරාවම සිත ඇදියන විට
සාගෙ අනි නමක් කොතැනද?

බන්දු දෙනෙතින් නැවන දියනිය දෙස
හැරී බැලුවිට පෙනුනි මා බොඳවූ දෙනෙතට
පොතක් අනාගිව මේ මොහොතේ සිහිය යුතුබව
නොදැනගේ ඇයිද මගේ උමතු බනසට

සොයනු වෙනුවට උත්තර විගගෙට
බැදියමන් සිතුපී දැකපු සිගබට
නිදි කිරා වැටෙනා කලාස් රුමගේ ඉද
දියනියගේ මුහුනත බලෙස් සතුදින.

වරනයෙන් පිරි මගේ ලෝකයකට
කුමටදෝ දැන උගතුන්ගේ අයකම
බරියානට පීසියේක් හෙතු රගනට
දුන්නේද හිබකම පුතානුවන් හා දියනිය.

පානු දුන්නද අත් අය බැරිරූද් කම
ඇගිලි නොපසනා ලෙසට කවේ සැර ගතට
කුමට විකසමද අත් අයගේ සාදන
මගේ ලොව තුල නැගුම හිමි නැත.

L.R. පෙරේරා

## එක් සැඳෑවක

ඉරත් අවරට ගිහින්
සැඩිමට අමතක වගෙයි
ටිකක් දුක හිතෙනවා
ඒත්..
ඔන්න ඔහෙ කමක් නෑ

ට්‍රින්.... ට්‍රින්.... ට්‍රින්.... ට්‍රින්....
කවුද.... මේ අවේලාවෙ
ටිකක් බය හිතෙනවා
ඒත්..
දොර අරින්නම්

පාට පාට මල් පොකුරක්
රස මසවුළු පිඟන් පිඟන්
කන් පිපිරෙන සිනා හරෑක්
නෑඳෑ හිත මිතුරු කැලක්

නිලා කුරු තරු වාගේ
සතුටු මුහුණු හඳ වාගේ
හැඩ වැඩ දැමු කේක් එකේ
ඉටි පන්දම් ආලෝකේ

මොකද කට බලියගෙන
මොකද ගල් ගැහිලා
හිතුවෙ නැහැනේ ඔයා
අපට මතකයි කියා

නෙතේ කඳුළුත්
ලයේ ගැස්මත් පරදලා
සවනතෙහි වැදී මිහිරි ?
සැමොම එකතුව කියූ වදන් ?
සුබ උපන් දිනයක් වේවා!

ලක්ෂ්මී ගුණරත්න